# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනය

(2022 අංක 105 දරන පාර්ලිමේන්තු පනත් කෙටුම්පත හරහා සංස්ථාපනය කිරීමට කටයුතු යොදා ඇත.)

ව්‍යාභාරික මනෝවිද්‍යාව පිළිබඳ සාමාන්‍ය සහතිකපත්‍ර පාඨමාලාව - 2024 (අතිරේක බඳවා ගැනීම)

ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන විවෘත විද්‍යායතනයේ ව්‍යවහාරික මනෝවිද්‍යාව පිළිබඳ සාමාන්‍ය සහතිකපත්‍ර පාඨමාලාව හැදෑරීමට අපේක්ෂා කරන අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ. මෙම පාඨමාලාව හරහා සහතිකලත් වෘත්තීය මනෝ උපදේශකවරයෙකු/මනෝ උපදේශකවරියක් වීමට හෝ මනෝවිද්‍යාව උසස් අධ්‍යාපනය සඳහා හැදෑරීමට උනන්දුවක් දක්වන පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අයට ඉල්ලුම් කළ හැකිය.

*සුදුසුකම්* : අ.පො.ස. (උසස් පෙළ) ඕනෑම විෂය ධාරාවකින් ලබාගත් S සාමාර්ථ 3ක් සහිතව සමත් වීම ;

*සහ*

2024.09.02 දිනට වයස 18ට වැඩිවීම, යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත වීම.

පාඨමාලාවේ ස්වභාවය : මාර්ගගත ඉගැන්වීම් ක්‍රමවේදය (විවෘත සහ දුරස්ථ අධ්‍යයනය).

*මාධ්‍ය* : සිංහල හෝ ඉංග්‍රීසි

පාඨමාලා කාලය :
සය මාසික අර්ධ කාලීන පාඨමාලාවකි. පහසු දිනයන් තුළ නැරඹිය හැකි පටිගත කළ දේශන සහ අතිරේක කියවීම් ඇතුළත් අන්තර්ජාල සබැඳියාවන් දේශන තුළ දී ලබා දේ.

පාඨමාලා ගාස්තු සහ ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තු : මුළු පාඨමාලා ගාස්තුව රු. 12,900.00 කි.

පාඨමාලාව සඳහා ලියාපදිංචිවීමේ දී රු. 900.00 ක ශිෂ්‍ය ලියාපදිංචි ගාස්තුව ගෙවිය යුතු ය.

රු. 12,000.00 ක මුදල එකවර හෝ රු. 2000.00 බැගින් සය මාසිකව ගෙවිය හැකිය.

පාඨමාලාව සඳහා අයදුම් කළ යුතු ආකාරය :
අයදුම්කරු විසින්,

1. තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ජාතික හැඳුනුම්පතේ/විදේශ ගමන් බලපත්‍රයේ ඉදිරි සහ පිටුපස ඡායාරූපය
2. අ.පො.ස. (උසස් පෙළ) විභාග ප්‍රතිඵල ලේඛනයේ ඡායාරූපය,
3. තම වර්ණවත් පැහැදිලි ඡායාරූපය (මාර්ගගත ශිෂ්‍ය හැඳුනුම්පත සැකසීම සඳහා),

070-419 1660 (WhatsApp) අංකයට යොමු කළ යුතු ය.

පාඨමාලාව සඳහා ශිෂ්‍යයින් බඳවාගන්නා අවසාන දිනය : **2024.09.30** වේ.

වැඩි විස්තර සඳහා : කාර්යාලයීය වේලාවන් වන පෙ. ව. **8.30** සිට ප. ව. **4.30** දක්වා **032-3137500** දුරකථන අංකය හරහා විමසිය හැකිය.

ලේඛකාධිකාරී - මනෝවිද්‍යා දෙපාර්තමේන්තුව,
ශ්‍රී ලංකා චිත්ත මනෝවිද්‍යා උසස් අධ්‍යාපන
විවෘත විද්‍යායතනය.

09-92